



# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය තරගාවලිය 2020

ලොව පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්තවී යන කොරෝනා වෛරසයේ බලපෑම ශ්‍රී ලංකාවට ද එල්ලවීම හේතුවෙන් සිය නිවෙස් තුළට වී සෞඛ්‍යාරක්ෂිතව තම අධ්‍යාපන කටයුතුවල නිරත වීමට අපේ ආදරණීය දූ දරුවන්ට සිදුව ඇත. මෙවන් මොහොතක දුරස්ථකරණ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යටතේ දකුණු පළාත් අධ්‍යාපන ලේකම්තුමාගේ සහ අධ්‍යක්ෂතුමාගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ පළාත් විෂය අධ්‍යක්ෂගේ සංකල්පයක් පරිදි දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය අංශය විසින් සංවිධානය කරනු ලබන මෙම තරගය සඳහා ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක නියෝජනය කරන රජයේ පාසල් සහ පිරිවෙන්වල අධ්‍යාපනය ලබන සිසු දරු දැරියන්ට හා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ඉදිරිපත් විය හැකිය.

දිවයින පුරා ව්‍යාප්ත වෙමින් පවත්නා කොරෝනා වසංගතය පරාජය කොට රට සංවර්ධනය කිරීමේ ආත්මීය සංකල්පය පෝෂණය කිරීම මෙමගින් අපේක්ෂා කෙරෙන අතර ම ජාති, ආගම් භේදයකින් තොරව සියලු දෙනාම එක්ව නැගීසිටීමට අවශ්‍ය ආකල්ප දරුවන් තුළ සංවර්ධනය කිරීම ද මෙහි මූලික අභිමතාර්ථයකි.

1. තරග අවස්ථා

   1.1 ප්‍රවෘත්ති කියවීමේ තරගය (සිංහල හෝ දමිළ)
   (10 සිට 13 ශ්‍රේණි/ පිරිවෙන් 4 ශ්‍රේණියේ සිට අ.පො.ස (උසස් පෙළ))

      1.1.1 තේමාව - ***මේ දිනවල ශීඝ්‍රයෙන් පැතිර යන කොරෝනා වෛරසය මර්දනය කිරීමේ සෞඛ්‍යමය ප්‍රවෘත්තියක් ඉදිරිපත් කළ යුතුය.***

      1.1.2 කාලය තත්පර 90

1.1.3 Smart වර්ගයේ ජංගම දුරකථනයකින් වීඩියෝ ගත කර ඉදිරිපත් කළ යුතුය.

1.1.4 10 - 13 දක්වා ශ්‍රේණිවල ශිෂ්‍ය /ශිෂ්‍යයාවන්ට පමණක් සහභාගි විය හැකිය.

1.2කාටුන් චිත්‍ර තරගය

(6 සිට 13 ශ්‍රේණි/ පිරිවෙන් 1 ශ්‍රේණියේ සිට අ.පො.ස (උසස් පෙළ))

1.2.1 තේමාව - ***corona වසංගතයෙන් පසුබෑමට ලක්වූ මව්බිම නැවත ගොඩනැගීම ලක්වාසී අප සියලු දෙනාගේ වගකීමයි. මෙම අදහස ඉදිරිපත් වන ආකාරයට කාටුන් චිත්‍ර නිර්මාණ කළ යුතු අතර සුදුසු තේමා පාඨයක් ද යෙදිය යුතුය.***

1.2.2 A4 ප්‍රමාණයේ සුදු කඩදාසියක චිත්‍රය නිර්මාණ කළ යුතුය.

1.2.3 කළු කාබන් පෑන හෝ කළු ජෙල් පෑන භාවිත කර චිත්‍රය නිර්මාණය කළ යුතුය.

1.2.4 Smart වර්ගයේ ජංගම දුරකථනයකින් / කැමරාවකින් ඡායාරූප ගත කර හෝ Scan යන්ත්‍රයක් ආධාරයෙන් Scan කර ඉදිරිපත් කළ යුතුය.

1.2.5 6 -13 දක්වා ශ්‍රේණිවල ශිෂ්‍ය /ශිෂ්‍යාවන්ට පමණක් සහ සහභාගි විය හැකිය.

2. ත්‍යාග සහ සහතික පත්‍ර පිරිනැමීම

2.1 ප්‍රවෘත්ති කියවීමේ තරගය

(10 සිට 13 ශ්‍රේණි/ පිරිවෙන් 4 ශ්‍රේණියේ සිට අ.පො.ස (උසස් පෙළ))

10 – 13 දක්වා එක් එක් ශ්‍රේණි මට්ටමින් ජයග්‍රාහකයින් 10 දෙනෙකු බැගින් තෝරාගෙන සහතික පත්‍ර ලබා දෙන අතර, ශ්‍රේණි මට්ටමින් 1,2 හා 3 ස්ථාන සඳහා ත්‍යාග පිරිනැමේ.

සිංහල හා දමිළ මාධ්‍ය වෙන් වශයෙන් තෝරණු ලැබේ.

2.2 කාටුන් චිත්‍ර තරගය

(6 සිට 13 ශ්‍රේණි/ පිරිවෙන් 1 ශ්‍රේණියේ සිට අ.පො.ස (උසස් පෙළ))

6 – 13 දක්වා එක් එක් ශ්‍රේණි මට්ටමින් ජයග්‍රාහකයින් 10 දෙනෙකු බැගින් තෝරාගෙන සහතික පත්‍ර ලබා දෙන අතර, ශ්‍රේණි මට්ටමින් 1,2 හා 3 ස්ථාන සඳහා ත්‍යාග පිරිනැමේ.

3. තරගය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම හා කොන්දේසි.

3.1 එක් ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට ඉදිරිපත් විය හැක්කේ එක් තරග අවස්ථාවකට පමණි.

3.2 සියලුම නිර්මාණ හා අයදුම් පත්‍ර Smart වර්ගයේ ජංගම දුරකථනයකින්/ කැමරාවකින් ඡායාරූප ගත කර හෝ Scan යන්ත්‍රයක් ආධාරයෙන් Scan කර PDF ගොනුවක් ලෙස විද්‍යුත් තැපැල (email) ඔස්සේ අප වෙත එවිය යුතුය.

3.3 සියලුම **නිර්මාණ 2020.05. 29 දින මධ්‍යම රාත්‍රී 12ට පෙර** විද්‍යුත් තැපැල (email) ඔස්සේ අප වෙත එවිය යුතුය.

3.4 සියලුම නිර්මාණ විනිශ්චය මණ්ඩලයක් විසින් තෝරාගන්නා අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

3.5 සියලුම නිර්මාණ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු වේ.

3.6 කාටූන් නිර්මාණ තම අයුදුම් පත්‍රය සමග පිටු දෙකකින් සමන්විත වන ආකාරයට එකම PDF ගොනුවක් ලෙස ඔබගේ නම සමග උදාහරණයේ දක්වා ඇති ආකාරයට ඔබ පාසල අයත් දිස්ත්‍රික්කයට අදාළ විද්‍යුත් තැපැල (email) වෙතට එවිය යුතුය. (උදා: AKM_Kumara_CT_Nelumdeniya_MV_Grade6)

3.7 ප්‍රවෘත්තිය ඇතුලත් වීඩියෝව පැහැදිලිව පෙනෙන පරිදි බාහිර ශබ්දයන්ගෙන් තොරව, ඔබගේ පාසල් නිල ඇඳුමින් පමණක් (නිල ලාංඡනය හෝ ටයි පටිය පැහැදිලිව පෙනෙ පරිදි) වීඩියෝ ගත කළ යුතුය.

ඔබගේ නමින් උදාහරණයේ දක්වා ඇති ආකාරයට එම වීඩියෝව ඔබ පාසල අයත් දිස්ත්‍රික්කයට අදාල විද්‍යුත් තැපැල (email) වෙතට එවිය යුතුය.
(උදා: AKM_Kumara_VD_Nelumdeniya_MV_Grade10)

3.8 සියලුම වීඩියෝ හා කාටූන් චිත්‍ර PDF පහත පරිදිම නාමකරණය විය යුතුය. එලෙස නොවන නිර්මාණ ප්‍රතික්ෂේප කෙරෙණු ඇත.

**කාටූන් චිත්‍ර තරගය**

කාටූන්

AKMKumara_CT_NelumdeniyaMV_G6

ඔබේ නම පාසලේ නම ඉගෙනුම ලබන ශ්‍රේණිය

AKMKumara_CT _NelumdeniyaMV_G7

AKMKumara_CT _NelumdeniyaMV_G8

AKMKumara_CT _NelumdeniyaMV_G9

AKMKumara_CT _NelumdeniyaMV_G10

AKMKumara_CT _NelumdeniyaMV_G11

AKMKumara_CT _NelumdeniyaMV_G12

AKMKumara_CT _NelumdeniyaMV_G13

AKMKumara_CT_ NelumdeniyaMV _G6.pdf

**ප්‍රවෘත්ති කියවීමේ තරගය**

වීඩියෝ

AKMKumara_VD_NelumdeniyaMV_G10

ඔබේ නම පාසලේ නම ඉගෙනුම ලබන ශ්‍රේණිය




AKMKumara_VD
_NelumdeniyaMV_G10
.mp4

AKMKumara_VD_NelumdeniyaMV_G11

AKMKumara_VD_NelumdeniyaMV_G12

AKMKumara_VD_NelumdeniyaMV_G13

3.9 ගෙන ඔබගේ සියලුම වීඩියෝ හා කාටූන් චිත්‍ර PDF කර පහත රූප සටහන උදාහරණයට ගෙන විද්‍යුත් තැපැල (email) වෙතට එවිය යුතුය.



3.10 නිර්මාණ එවිය යුතු විද්‍යුත් තැපැල් (email) ලිපින ඒ ඒ දිස්ත්‍රික්කවලට පහත පරිදි  වේ. නියමිත විද්‍යුත් තැපැල් (email) ලිපිනයට යොමු කළ යුතු අතර එසේ යොමු කර නොමැති නිර්මාණ ප්‍රතික්ෂේප වේ.

| දිස්ත්‍රික්ය | ප්‍රවෘත්ති | කාටූන් චිත්‍ර |
|---|---|---|
| ගාල්ල | spedmediagv@gmail.com | spedmediagc@gmail.com |
| | | |
| මාතර | spedmediamv@gmail.com | spedmediamc@gmail.com |
| | | |
| හම්බන්තොට | spedmediahv@gmail.com | spedmediahc@gmail.com |

**ආදර්ශ අයදුම්පත්‍රය පහත දක්වා ඇත.**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය තරගාවලිය 2020

## <u>අයදුම් පත්‍රය</u>

1. සම්පූර්ණ නම ..........................................................................
2. උපන් දිනය ..........................................................................
3. ජා.හැ. අංකය ..........................................................................
4. ඉගෙනුම ලබන ශ්‍රේණිය ..........................................................................
5. ඇතුලත් වීමේ අංකය ..........................................................................
6. තරග අවස්ථාව ..........................................................................
7. පාසල/ පිරිවෙන හා ලිපිනය ..........................................................................

   ..........................................................................
8. දුරකථන අංකය පාසල ..........................................................................

   නිවස ..........................................................................
9. විද්‍යුත් ලිපිනය ..........................................................................
10. අධ්‍යාපන කලාපය ..........................................................................
11. දිස්ත්‍රික්කය ..........................................................................
12. වීඩියෝව/ කාටුන් චිත්‍රයට අදාළ ගොනුවේ (file name) නම ..........................................................................

    ..........................................................................

ඉහත සඳහන් කරුණු සත්‍යය හා නිවැරදි බවත් තරගය සඳහා ඉදිරිපත් කරන නිර්මාණය ස්වයං නිර්මාණයක් බව සහතික කරමි

දිනය ............................ ................................

අයදුම්කරුගේ අත්සන